අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මාර්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 24 වන දින]**

**එල්. ඩී.—ඕ. 65/87**

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—**

1. මේ පනත 1988 අංක 6 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 69 දරන පනතේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(4අ) (5) වන උපවගන්තියේ සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, භාණ්ඩ සෑදීමේ හෝ නිපදවීමේ ව්‍යාපාරය කරගෙන යන ("සැපයුම්කරු" යනුවෙන් මේ වගන්තියෙහි මින් මතු සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු විසින්, යම් අපනයනකරුවකුට ඒ භාණ්ඩ සපයනු ලබන්නා වූ බවට සහ ඒ භාණ්ඩ සැපයීමට අදාළ අපනයනවල විදේශ විනිමය වටිනාකම ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම සඳහා වූ ජාත්‍යන්තර ණයවර ලිපියක් මත අනුයාත පදනම උඩ ශ්‍රී ලංකාවේ බැංකුවක විවෘත කරන ලද ණයවර ලිපියකින් ඒ සැපයීම ආවරණය කර ඇති බවට, සහ

(i) එසේ සපයන ලද භාණ්ඩ සෑදීමෙහි ලා හෝ නිපදවීමෙහි ලා ඒ සැපයුම්කරු විසින් ප්‍රයෝජනයට ගන්නා ලද අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ඒ සැපයුම්කරු විසින් සත්‍ය වශයෙන් ම ප්‍රධාන රේගු අයකැමිවරයාට ගෙවා ඇති බවට ; හෝ

(ii) (අ) ඒ භාණ්ඩ සෑදීම හෝ නිපදවීම සම්බන්ධයෙන් යොදන ලද ලෙස ආරෝපනය කළ හැකි අමු ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ඒ සැපයුම්කරු විසින් ගෙවන ලද මිල, ඒ අමු ද්‍රව්‍ය මිලට ගනු ලැබුවේ යම් සාදන්නකුගෙන් නැතහොත් නිපදවන්නකුගෙන් ද ඒ සාදන්නාට හෝ නිපදවන්නාට ගෙවන ලද බවට ; සහ

(ආ) එම අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආරෝපනය කළ හැකි තම ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් එම අමු ද්‍රව්‍ය සාදන්නා හෝ නිපදවන්නා

2—ඒ 00874—7,585 (88/01)

විසින් පිරිවැටුම් බද්ද සත්‍ය වශයෙන්ම ගෙවා ඇති බවට

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ භාණ්ඩ සෑදීමෙහිලා හෝ නිපදවීමෙහිලා ප්‍රයෝජනයට ගන්නා ලද අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආරෝපනය කරනු ලබන, සැපයුම්කරු විසින් ගෙවන ලද පිරිවැටුම් බදු මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සැප යුම්කරුට ගෙවනු ලැබිය යුතු ය. ".

(2) ඒ වගන්තියෙහි (5) වන උපවගන්තියේ " (3) වන හා (4) වන උපවගන්තිවල" යන යෙදුම වෙනුවට " (3) වන, (4) වන සහ (4අ) වන උපවගන්තිවල" යන යෙදුම ආදේශ කිරීමෙන් ; තවද

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනු වට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) අපනයනය කරනු ලබන හෝ සපයනු ලබන යම් භාණ්ඩයක් හෝ යම් භාණ්ඩයක් සහ එම භාණ්ඩය බහා අපනයනය කරනු ලබන හෝ සපයනු ලබන භාජනය හෝ දවටනය සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ, (4) වන උපවගන්තිය යටතේ හෝ (4අ) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු ගෙවීමක් කිරීම, ඒ ගෙවීම සඳහා ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් ඒ භාණ්ඩය අපනයනය කිරීමෙන් හෝ සැපයීමෙන් මාස තුනකට පෙර නොවන සේ ද මාස නවයකට පසුව නොවන සේ ද ඒ භාණ්ඩයේ අපනයනකරු හෝ සැපයුම්කරු විසින්, ඉදිරිපත් කළහොත් මිස, නොකළ යුතු ය.".

අතීතයට බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන 1988 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි "පන් දහසක්" යන වචන වෙනුවට "පනස් දහසක්" යන වචන ද "දඩ" යන වචනය වෙනුවට "දණ්ඩනය" යන වචනය ද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.